# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII | DECEMBER 2023 | Issue No. 01


## ශුද්ධවූ බයිබලය

**(යෙසායා 9:1-6)**

01. ඔව්හු ඝණාන්ධකාරයට පත්නනු ලබන්නෝය. එහෙත් තද වේදනාවෙන් සිටියාවූ ඈට අඳුරක් නොවන්නේය. පළමු කාලයේදී උන්වහන්සේ සාබුලොන් රටද නප්තලී රටද පහත් කළසේක, නුමුත් අන්තිම කාලයේදී උන්වහන්සේ යොර්දාන් අසබඩ මුහුදු පළාතවූ ජාතීන්ගේ ගලීලය මහිමතාවට පැමිණවූසේක.

02. අන්ධකාරයෙහි ඇවිද්දාවූ සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය. මරණ සෙවණ ඇති දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් බැබළුණෝය.

03. ඔබ ජාතිය වැඩිකළසේක, ඔබ ඔවුන්ගේ ප්‍රීතිය වර්ධනයකළසේක. ගොයම් කපන කාලයෙහි සන්තෝෂවන්නාක් මෙන්ද මනුෂ්‍යයන් කොල්ලය බෙදාගන්න කල ප්‍රීතිවන්නාක්මෙන්ද ඔව්හු ඔබ ඉදිරියෙහි ප්‍රීතිවෙති.

04. මක්නිසාද ඔහුගේ බරවූ වියගහද ඔහුගේ කරේ දණ්ඩද ඔහුගේ පීඩාකාරයාගේ යෂ්ටියද මිදියන්හි දවසේදී මෙන් ඔබවහන්සේ කඩාදැමූසේක.

05. තවද කෝලාහලයට පැමිණෙන යුද්ධකාරයාගේ සියලු යුද්ධ වහන්ද ලෙයෙහි පෙඟු වස්ත්‍රද ගින්නෙහි දැවීමට දර පිණිස වන්නේය.

06. මක්නිසාද අපට ළදරුවෙක් උපන්නේය, අපට පුත්‍රයෙක් දෙනලද්දේය; ආණ්ඩුවද උන්වහන්සේගේ කර පිට තිබෙන්නේය. උන්වහන්සේගේ නාමය අපූර්වය, මන්ත්‍රීවරයාය, පරාක්‍රමවත් දෙවියන්වහන්සේය, සදාකාල පියාණෝය, සමාදානයේ කුමාරයායයි කියනු ලබන්නේය.

# කුමාරයාගේ තෑග්ග!

## THE GIFT OF THE PRINCE!

*(දේවගැති ඒන්ජල් සෙල්වකුමාරි)*



මාගේ කුඩා කාලයේ සිටම, නත්තලට විශේෂ වූ ස්ථානයක් හිමි වී තිබුණි. නත්තල මා හට කියා නිමකල නොහැකි සතුටක් ගෙන දෙන්නාවූ කාලයකි. මගේ තරුණ කාලයේදී අපට අළුත් ඇඳුම් ලබා ගැනීමට තරම් මුදල් නොතිබුණි. තෑගි ගැනීමටවත්, නිවස සැරසීමටවත් අලංකාර විදුලි ආලෝකයන්ගෙන් නත්තල සැරසීමටවත් අපට මුදල් නොතිබුණි. තෑගි ගැනීමටවත්, නිවස සැරසීමටවත් අලංකාර විදුලි ආලෝකයන්ගෙන් නත්තල සැරසීමටවත් අපට මුදල් තිබුනේ නැත. මන්ද අපට තිබුනේ එක් නිදන කාමරයකට සීමාවූ නිවසකි. අප ලබා ගත්තේ සීමා සහිත වූ කෑම ප්‍රමාණයක් පමණි. නමුත් මගේ දෙමාපියන් නිතරම අපව සතුටින් තබා ගැනීමට උපරිම වූ දේ කලේය. මගේ දෙමාපියන් මා සහ මගේ සහෝදරයා වෙනුවෙන් කළාවූ සෑම දේ උදෙසාම අප ඔවුන්ට සැමදාම ස්තුති වන්ත වෙමු. එම නත්තල් සමය ඉතා අරුම පුදුම වූ කාලයකි. මේ නත්තල් සමයේදී ආච්චි. සීයා, බැලීමටත් ඥාතීන් හමුවීමටත්, උදෙන්ම දේවස්ථානයට යාමටත්, එදින දහවල් කාලයේදී සාදන රසවත් වූ ආහාර ගැනීමටත් මුළු පවුල සමගම විනෝද වීමටත් යොමු වූ නිසා එම නත්තල් දින අපගේ ජීවිතය අලංකාරමත් හා ප්‍රීතිමත්වූ දෙයක් කලේය.

දැනුදු සෑම වසරකදීම කැවුම්, කොකිස් සාදා නිවස අලංකාර ලෙස සරසා ඒ සීත සුළං හමන විටත් නත්තල් ගී ඇසෙන විටත් මට එම කුඩා කාලය සිහියට නැගෙයි.

කෙසේ වෙතත් සමහර නත්තල් කාලවලදී අපට වෙනස්වූ අත්දැකීම් තිබේ. අප සමග ජීවත්වී අපෙන් වෙන්වී ගියාවූ අය අද අපත් සමග නැත කියා අපට මහත් වූ දුකක් ඇති වෙයි. තවත් සමහර අය මුදල්මය පැත්තෙන්

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!


Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



*from your dearly beloved brother...*

REACHING NATIONS



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858 95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

# කැඳවීමේ ප්‍රතිරාවය

"මාගේ ආත්මය ඔබට ඇලුම්ව ඔබ අනුව යයි. ඔබගේ දකුණත මා උසුලයි." (ගීතාවලිය 63:8)

**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්ත සහෝදර සහෝදරිය,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසමසම නාමයෙන් අපි ඔබට සුභ පතන්නෙමු. ඔබ සියලු දෙනාටම සුභ නත්තලක් සහ අසිරිමත් නව වසරක් වේවා කියා අපි ප්‍රාර්ථනා කරමු!

කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව සහ YouTube සේවාවන් අපගේ මෙම සඟරාව අපගේ මෙම සඟරාව කියවන්නාවූ පාඨකයින්ගෙන් අපට ලැබෙන්නාවූ සුභවාදී ප්‍රතිචාර නිසා අපි දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වෙමු. එසේම කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා විකාශනය වන්නාවූ අපගේ පණිවිඩ අසන්නාවූ අය නිසාත් ස්තුති කරමු. YouTube නාලිකාව ඔස්සේ සැමදාම උදෑසන 2 සිට ඉංග්‍රීසි, දෙමළ, තෙලිඟු භාෂාවන්ගෙන් විකාශනය වන්නාවූ විනාඩි 5 ක දේශනාවටද සවන්දෙන්න කියා ඉල්ලමු. ඔබගේ ජංගම දුරකථනයෙහි අපගේ දුරකථන අංකය වන +919841071858 ඇතුලත් කරගන්න. අපගේ YouTube නාලිකාවට ඔබත් දායක වෙන්න. එසේම ඔබට මා සමඟ කථා කිරීමට අවශ්‍ය නම්, +919841271858 යන දුරකථන අංකයට කථා කරන්න. අප ඔබ වෙනුවෙන් කරන්නාවූ සෑම සේවයක්ම නොමිලයේ ඉටු කරමි.

**තරුණ හා ළමුන් සුරැකීමේ ගෝලීය දර්ශනය**

තරුණ පිරිමි සහ ගැහැණු දරුවන් උදෙසාත් ළමුන් උදෙසාත් අප ලොව පුරා බොහෝ රටවල් හා සමඟ ඒකාබද්ධ වී තරුණ හා ළමුන් සුරැකීමේ ගෝලීය දර්ශනයක් තුළින් එක් මිනිත්තුවක් යාච්ඤා කිරීමේ සේවයක් ආරම්භ කර ඇත. ලෝකයේ බොහෝ රටවල් තුල වෙසෙන්නාවූ මිත්‍රයින් ඔවුන්ගේ නම මේ සේවය සඳහා ලියාපදිංචි කර ඇත. මෙසේ ලියා පදිංචි වූ සියලු දෙනාම සෑම දිනකදීම රාත්‍රී 10 ට එක් මිනිත්තුවක් ගෙන මෙම දර්ශනය උදෙසා යාච්ඤා කරන්න කියා ඉල්ලමි. මෙවැනි කෙටි යාච්ඤාවක් ඔප්පු කරන්න.

"ආදරණීය දෙවි පියාණනී, අපගේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් අද අපි ඔබට මෙසේ යාච්ඤා කරමු. ලොව වටා සිටින්නාවූ සෑම පිරිමි සහ ගැහැණු තරුණ තරුණියන් උදෙසාත් සියලුම දරුවන් උදෙසාත් අපි ඔබවහන්සේට යාච්ඤා කරමු. ඔවුන්ට ආශිර්වාද කරන්න. ආමේන්."



*Youth and Kids with Lord Jesus Christ!*

මෙම යාච්ඤාවේ, ප්‍රතිඵලයක් අද බොහෝ තරුණ, තරුණියන් හා දරවැන් යේසුස් වහන්සේ වෙතට එන බව දැකීම අපට බලවත් වූ ආශිර්වාදයකි. සියලු ගෞරවය

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

හා මහිමය ස්වාමීන්වහන්සේට වේවා. ආමේන්.

ඔබගේ දරුවන්ගේ නමත් ඔබ අප වෙත එවනවා නම්, අපගේ නම් ලැයිස්තුවට එය ඇතුලත් කරමු. අප හා සමඟ සේවයේ යෙදී සිටින්නාවූ බොහෝ අය මේ කාලය තුලදී කිසියම් පීඩනයක් තුළ ගමන් කරති. ඔවුන්ට බොහෝ අලාභ, අසනීප තත්වයන් වලට මුහුණ දෙමින් සිටින නිසා ඔබගේ යාච්ඤාවේදී මතක් කර ඔවුන්ගේ පවුල් නිසාත් යාච්ඤා කරන්න.

දෙසැම්බර් මස 31 වන දින රාත්‍රී 10 ට පවත්වනු ලබන අපගේ අලුත් අවුරුදු දේව මෙහෙය YouTube නාලිකාව හරහා සජීවීව විකාශනය කරන නිසා ඔබටත් එය නැරඹීමට හැකිය. ඔබගේ සභාවේදී එදින පවත්වනු ලබන්නාවූ අලුත් අවුරුදු දේව මෙහෙයට අනිවාර්යයෙන්ම සහභාගී වෙන්න. මන්ද දේව සභාවට යාම අත්‍යාවශ්‍ය දෙයකි.

2024 නව වසරේ ජනවාරි මස 2 වන දින සිට 2024 ජනවාරි මස 7 වන දින දක්වා සෑම දිනකම උදෑසන 6.00 ට අලුත් අවුරුද්දේ ආශිර්වාද ලබා ගැනීම පිණිස අප යාච්ඤාවක් කරන්නෙමු.

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මාර්ගයෙන් බොහෝ දෙනෙකුට ලැබෙන්නට සැලැස්වුවත් සියලු දෙනාටම එය නොලැබෙයි. එම නිසා ඔබගේ WhatsApp අංක හෝ විද්‍යුත් තැපැල් අංකය (E-Mail Address) අප වෙත එවන්න.

දෙසැම්බර් මාසයේදී අපගේ සෑම සේවකයින්ම බොහෝ වැඩසටහන් පවත්වන නිසා එම සේවාවන් සාර්ථකව ඉටු කර ගැනීමට ඔබගේ යාච්ඤාව අපි බලාපොරොත්තු වෙමු.

ඔබ සියලු දෙනාටම සුභ නත්තලක් හා අසිරිමත් නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරමු !

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858,
E.mail : sam@echoofhiscall.org

---

*1 පිටුවෙන්....*

මහත් පීඩනයකට පත් වී සිටිනවා විය හැක. තවත් සමහර අය අප මේ නත්තලේ තනිවී සිටිනවාය කියා සිතනවා විය හැක. එසේම ඉතාම දුකට පත්වෙන්නාවූ කාරණය නම් මේ නත්තල් සමයේදීත් බොහෝ දෙනෙක් දිවිනසා ගන්නවා ඇත.

මීට අමතරව යේසුස් වහන්සේ ඉපදුනේ දෙසැම්බර් 25 වන දිනද? ඇත්තෙන්ම යේසුස් වහන්සේ ඉපදුනේ එම දිනයේදීද? කියා ප්‍රශ්න කරයි. දිනය කෙසේ වෙතත් මට වැදගත් වන්නේ යේසුස් වහන්සේ මේ ලෝකයට ඉපදුන බව සත්‍ය වූ කාරණාවක් බවයි. දේව පුත්‍රයා මනුෂ්‍ය පුත්‍රයෙක් විය. අපට මෙම නත්තල වැදගත් වන්නේ මෙම සත්‍යතාවය නිසාවෙනි.

එබැවින් මගේ ජීවිතයට ලැබුණාවූ ලොකුම ත්‍යාගය නම් යේසුස් වහන්සේගේ ඉපදීම බවය කියා මා මේ ලෝකයට කීමට කැමැත්තෙමි. එම නිසා උන්වහන්සේගේ ඉපදීම මගේ මිත්‍රයින් හා මගේ පවුලේ අය සමඟ ඉතා සතුටින් සමරමු. එසේම පවුලක් නැති මිත්‍රයින් නැති ආමාරුකම් තුළ ජීවත් වෙන්නාවූ අයට දෙවියන්වහන්සේගේ ප්‍රේමය දක්වමින් අපට තිබෙන්නාවූ දේ ඔවුන් සමඟ බෙදා ගැනීමට මට ඉතාම සතුටකි.

නත්තලේදී සාමාන්‍යයෙන් වන දේ නම්, තෑගි ලබා දීමත් හා තෑගි ලබා ගැනීමත්ය. තවද අපගේ දරුවන්ට අපි අලුත් ඇඳුම් ලබා දෙනවා, අපගේ මිත්‍රයින්ට විශේෂ දේවල් ලබා දෙනවා, මෙයින් අප ඔවුන්ට ප්‍රේම කරන බවත් ඔවුන්ට සලකන බවත් පෙන්වන අතර අපට තිබෙන්නාවූ ප්‍රීතිය අප ඔවුන් හා සමඟ බෙදා ගන්න බවත් පෙන්වමු. බටහිර රටවල් වල සිටින්නාවූ මිනිසුන් අගෝස්තු මාසයේදී පටන්ම සාප්පු සවාරි යාමට පටන් ගනී. එකිනෙකාට තෑගි ලබා දීම ඔවුන්ට ඉතාම වැදගත් වූ දෙයකි. නමුත් බොහෝ දෙනෙක් මේ නත්තලේ තිබෙන්නාවූ අරුතත් අපට මෙම නත්තලේදී ලැබුණාවූ ඉතා උතුම්වූ සතුටත් අමතක කර දමන දෙවියන්වහන්සේ විසින් මනුෂ්‍යයාට දුන්නාවූ ඉතා උතුම් වූ දීමනාව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. අද මනුෂ්‍යයින් මෙම උතුම්වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සමරන්නේ නැතිව වෙනත් විවිධ වූ කාරණාවන්ට තමාගේ අවධානය යොමු කර තිබේ.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉපදීම කරණකොට ගෙන අපට දීමනාවන් 5 ක් ලබා දුන්නේය. එනම්,**

**(1). සම්පූර්ණවූ පොරොන්දුව**



*For unto us a Child is born!*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉපදීම තුළින් දෙවියන්වහන්සේගේ පොරොන්දුව උන්වහන්සේ ඉෂ්ඨකල බව අපට මතක් කර දෙයි. උන්වහන්සේ කුමක් පවසන්නේද, එය උන්වහන්සේ ඉෂ්ඨ කරයි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය වෙනස් කිරීමට මනුෂ්‍යයෙක් නොවන්නේය. උන්වහන්සේ කී දෙය ඉෂ්ඨ කිරීමට ප්‍රමාද වුවත් නිතරම උන්වහන්සේ තම පොරොන්දු ඉෂ්ඨ කරන්නේය. දේව වචනයෙහි මෙසේ පවසයි. *''අහසත් පොළොවත් පහවන්නේය. නුමුත් මාගේ වචනය පහ නොවන්නේය.'' (මතෙව් 24:35)* අප මනුෂ්‍යයන් හැටියට යමක් පොරොන්දු වුවානම් එය සති කීපයකින්, මාස කීපයකින් හෝ එසේත් නොමැතිනම් වසරක් ගෙවී යන විටදී අපට එය අමතක වී යනු ඇත. නමුත් දෙවියන්වහන්සේ අපට යමක් පොරොන්දු වුවානම් උන්වහන්සේ එය ඉෂ්ඨ කරන බව අප මතක තබා ගත යුතුයි. සමහර විටදී එය අපගේ ජීවිතකාලයේදී හෝ අපගේ දරුවන්ගේ ජීවිත කාලයේදී හෝ සිදු වෙයි. දෙවියන්වහන්සේ එදා යුදාවරුන්ට මෙසායා කෙනෙක් එවන බවට පොරොන්දු වූවාක්

මෙන් උන්වහන්සේ මෙසායාව එවා එම පොරොන්දුව ඉෂ්ඨ කලේය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඉපදීම තුළින් බයිබලයේ පරණ ගිවිසුමෙහි කියා තිබෙන්නාවූ පොරොන්දු 44 ක් ඉෂ්ඨ වූ බව බයිබල් විශාරදයින් පවසයි. උදාහරණයක් ලෙස පැවසුවහොත්, උත්පත්ති 3:15 හි සඳහන්ව ඇති අකාරයට මෙසායා පැමිණෙන්නේ, ස්ත්‍රීයකගේ බීජය තුළින් බවයි. මෙම පොරොන්දුව මතෙව් 1,20 හි සඳහන්ව ඇති ආකාරයට ඉෂ්ඨ විය. යේසුස් වහන්සේ ඉපදෙන්නාවූ ස්ථානය ගැන මලාකි 5:2 හි සඳහන්ව ඇති අතර මතෙව් 2:1 හි එය ඉෂ්ඨ වූ බව සඳහන් කරයි. මෙලෙස දෙවියන්වහන්සේ විසින් පැවසුවාවූ බොහෝ පොරොන්දු ඉෂ්ඨ වූ බව එකින් එක නම් කල හැකි නමුත් වඩා වැදගත් වන්නේ, දෙවියන්වහන්සේගේ සෙනඟ වසර ගණනාවක් උන්වහන්සේ දුන්නාවූ පොරොන්දු ඉෂ්ඨවන තුරු බලා සිටියෝය. මේ දේ අප තේරුම් ගත යුතුයි.

ප්‍රිය දෙවියන්වහන්සේගේ දරුවෙනි, යේසුස් වහන්සේ ඔබට යමක් ගැන පොරොන්දු වී තිබෙනවා නම්, ඇදහිල්ලෙන් දිගටම යාච්ඤා කරන්න. අත්නොහරින්න. ඔබ සුළඟ හා වර්ෂාව නොදකින නමුත් ඔබගේ මිටියාවත ජලයෙන් පිරෙන්නේය. යේසුස් වහන්සේ යමකට 'එසේය' කියා පවසන විටදී එය 'නැත' කියා කිසිවෙකුට පැවසීමට බැරිය. උන්වහන්සේ පොරොන්දු ඉෂ්ඨ කරන්නාවූ දෙවියන්වහන්සේ වන නිසා ඔබත් ඇදහිල්ලෙන් ස්ථිරව සිටින්න. ඔබ දැන් සිටින්නාවූ වාතාවරණය තුලදී දෙවියන්වහන්සේගේ පොරොන්දු ඉෂ්ඨ නොවන බව ඔබ දැන් දුටුවත් මතුයම් දවසකදී ඔබට එම පොරොන්දු ඉෂ්ඨ වන බව ස්ථිරය.

මේ නත්තල් කාල වකවානුව තුලදී අප මතකතබා ගත යුතු දෙයක් නම්, දෙවියන්වහන්සේ තවමත් අප උදෙසා ක්‍රියා කරමින් සිටින අතර උන්වහන්සේ අපට දුන්නාවූ පොරොන්දු ඉෂ්ඨ කරයි.

උන්වහන්සේගේ වේලාවට සෑමදේම ඉතා අලංකාරව සිදුවෙයි. උන්වහන්සේගේ වේලාව පැමිණෙන තුරු ඉවසිල්ලෙන් බලා සිටින්න. උන්වහන්සේගේ වේලාව සම්පූර්ණයි. උන්වහන්සේට සියල්ලම කළ හැකිය. එළිසබෙත්, මරියා, සීමොන් සහ හන්නා යන පුද්ගලයින් ඔවුන්ගේ ජීවිත දෙවියන්වහන්සේට කැප කලාක් මෙන් ඔබත් ඔබගේ ජීවිතය දෙවියන්වහන්සේට කැප කරමින් උන්වහන්සේ පොරොන්දු ඉෂ්ඨ වන තුරු බලා සිටින්න. මේ සියලු දෙනාගේම ජීවිත වල දෙවියන්වහන්සේ ගේ පොරොන්දු ඉෂ්ඨ වන ආකාරය ඔවුන්ගේම ඇස්වලින් දුටුවේය.

## (2). සමාදානයේ දීමනාව

දෙවනුව දුන් තෑග්ග නම් සමාදානයයි. උන්වහන්සේගේ නාමය නම්, සමාදානයේ කුමාරයාය. අපගේ ජීවිත වලට වඩා වැදගත්වූ දෙයක් නම්, සමාදානයයි. සමාදානය නොමැතිව අපගේ ජීවිතවල කිසි දෙයක් කිරීමට බැරිය. අපට ඉතා වටිනාවූ අධි සුඛෝපභෝගී වාහනයක්, ඉතා අධික මිලකින් යුත් නිවසක්, උසස් වැටුපක් සහිත රැකියාවක්, විශාල දැවැද්දක්, බොහෝ ධනවත් ස්වාමි පුරුෂයෙක් හා විවිධ හැකියා සහිත දරුවන් සිටියත් අප තුළ සමාදානය නැති නම් අපට ඇති මේ සියලුම දෙයින් කිසිම ඵලක් ලැබෙන්නේ නැත.

දිනක් එක්තරා තරුණයෙක් මට මෙසේ පවසනු ලැබීය. ''විශාල නිවසක් තුලට වී අඬ අඬා සිටිනවාට වඩා කුඩා නිවසක් තුළ සතුටින් හා සමාදානයෙන් සිටීම ඉතා වටිනවා'' ය කියාය. ඔහු පැවසූ දෙයට සැබවින්ම මගේ හදවත ඇදී ගියේය. අද අප ජීවත්වෙන්නාවූ සමාජය තුල අන් අයට පෙනෙන ලෙස දේවල් කරති. අපට තිබෙන්නාවූ වස්තුව හා බලය නිසා අප ඉතාම සාර්ථක කියා අන් අයට පෙන්වීමට උත්සාහ දරති. නමුත් අප තුළ තිබිය යුතු ඉතාම වටිනාවූ වස්තුව නම්, සමාදානයයි.

යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, ''මා ඔබට දෙන්නාවූ සමාදානය නුඹලාට සෑහෙයි'' කියාය. එසේම ඉලක්කන් 10 කින් යුත් මුදලක් සහිත බැංකු ගිණුමක් ඔබට තිබෙන්නට පුළුවනි. එසේ නොමැති නම් ඔබට හොඳ පවුලක් තිබෙන පුද්ගලයෙක් හෝ තනි පුද්ගලයෙක් වීමට හැකිය. ඔබ උගත් වැදගත් වෛද්‍යවරයෙක් වීමට හැකිය. ඔබ පුරුෂයෙක්, ස්ත්‍රීයක්, තරුණයෙක් හෝ මහළු කෙනෙක් වීමට පුළුවනි. එහෙත් මේ කිසිම දෙයක් ප්‍රයෝජනයක් නොමැතිය. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, ***''වෙහෙසවන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි, මා වෙතට එන්න, මම නුඹලාට සහනය දෙමි'' (මතෙව් 11:28) ''නුඹලා වෙත සමාදානය තබා යමි, මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ.....'' (යොහාන් 14:27)*** දෙවියන්වහන්සේගෙන් ලැබෙන්නාවූ සමාදානය අපගේ සිතුවිල්ලටත් දැනගැන්මටත් වඩා විශාලය. මෙම සමාදානය දානියෙල් සිංහ ගුහාවෙහි අත්දුටුවේය. ඇවිලෙන ගිනි උඳුනට හෙබ්‍රෙව් තරුණයන් තිදෙනාව හෙලනු ලබන විටදී ඔවුන් තුළ තිබුනේද මෙම සමාදානයයි.

යේසුස් වහන්සේ දෙන්නාවූ සමාදානයට සීමාවක් නැත. ඔබගේ ජීවිතයේද කුණාටු මැදදී උවද මෙම සමාදානය අත්දැකිය හැක. මන්ද උන්වහන්සේ සමාදානයයි. උන්වහන්සේ අපගේ ජීවිතයේ සෑම අවස්ථාවක්ම පාලනය කරන්නාවූ පියාණන්වහන්සේයි. දෙවියන්වහන්සේගේ අනුමැතියෙන් තොරව කිසි දෙයක් අපගේ ජීවිතයට විරුද්ධව සිදු නොවෙයි. එසේම කිසිම විරුද්ධ දෙයක් අපට විරුද්ධව එන්නටද බැරිය. එවැනි ස්ථීරත්වයක් හා ඇදහිල්ලක් අපට තිබිය යුතුය. යේසුස් වහන්සේ අපව කිසිදා අත් නොහරියි.

ප්‍රිය මිත්‍රය, ඔබත් ඔබගේ ජීවිතය තුළ කිසියම් වියළි කාලයක් තුල ගමන්කරනවා විය හැක. එසේත් නොමැති නම්, ඔබ කුණාටු මධ්‍යයේ ගමන් කරන්නාවූ අත්දැකීමක් තුළ ගමන් කරනවා විය හැක. මගේ ජීවිතයේද එක් වතාවක් දෙවතාවක් නොව බොහෝ අවස්ථාවන්

*6 වෙනි පිටුවට....*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**දෙසැ:19-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල නෙහෙමියා බයිබල් විදුහල සහ දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:20-** කැඳවීමේ ප්‍රතිරාවය දේව සේවය තුළ පරිවර්තකයන්, සහකාර කතෘවරුන් සහ සම්බන්ධීකරුවන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:21-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළ මහත් කැපවීමෙන් සේවය කරන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:22-** කැපවීමෙන් සේවය කරන දේව සේවකයන් මත ආශිර්වාද වැස්සක් වසින පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:23-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ප්‍රධාන සභා පාළකතුමා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් නපුරෙන් ආරක්ෂා වන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:24-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය තුළින් නෙහෙමියා බයිබල් විදුහල 2 වන වාරය සාර්ථකව අවසන් කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:25-** දෙසැම්බර් මාසය පුරාම කිතුණුවන් පැවැත්වූ ආත්මික සැමරුම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:26-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සඳහා ලියාපදිංචි සහතික ලබාගැනීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:27-** යාච්ඤා සේවය, ඇදහිල්ලේ සේවය මහා නියෝගය ඇතුළු සෑම සේවයකටම සම්බන්ධ සහායකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:28-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සියලුම දේවධර්ම පාඨමාලාවන් වල වර්ධනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:29-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත බෙදාහැරීමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:30-** මේ වසර පුරාම නෙහෙමියා බයිබල් විදුහල හොඳින් පවත්වාගෙන යාමට හැකිවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**දෙසැ:31-** මේ වසර පුරාම අපේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට උපකාර කල දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න

**ජන:01-** ලැබුවාවූ නව වසර කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත කියවන පාඨකයන් ඇතුළු ලෝවාසී සියලුම මනුෂ්‍යයන්ට සාමය ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**ජන:02-** සියලුම කිතුණු දේව සභාවන් සහ ඇදහිලිවතුන් මේ වසරේදී බලවත් ආශිර්වාද ලබාගන්නා පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

**ජන:03-** සියලුම කිතුණු සංවිධානය මේ වසරේදී බලවත් ආශිර්වාද ලබාගන්නා පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ජන:04-** තරුණ ප්‍රජාව තුළින් ප්‍රචණ්ඩත්වය නැතිව ගොස් ඔවුන් ශුද්ධාත්මයයෙන් පිරෙන පිනිස යාච්ඤා කරන්න

**ජන:05-** සෑම කිතුණු පවුලකම සාමය උදෙසා යාච්ඤා කරන්න

**ජන:06-** ලෝකයේ රාජ්‍ය නායකයින් ප්‍රඥාවෙන්තම රටේ ජනතාවගේ ශුභසිද්ධිය ගැන කටයුතු කරන පිනිස යාච්ඤා කරන්න

**ජන:07-** සෑම පවුලකටම සරිලන ආදායම් මාර්ග ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජන:08-** කිතුණු අධ්‍යාපන ආයතන තම කීර්තිය ආරක්ෂා වෙන අන්දමට කටයුතු කරන පිනිස යාච්ඤා කරන්න

**ජන:09-** සෑම කිතුණුවෙක්ම ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ ආකාරයට තම චරිතය සකසාගන්නා පිනිස යාච්ඤා කරන්න

**ජන:10-** සෑම රටකම ආර්ථික වර්ධනය පිනිස යාච්ඤා කරන්න

**ජන:11-** මේ වසර පුරාම පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ සියලුම දෙනා දෙවිඳුන්ගේ බලවත් හස්ථයට යටත් කරමින් යාච්ඤා කරන්න

**ජන:12-** දේව සභාවලට එල්ලවන දුෂ්ට බලවේග වලින් ආරක්ෂා කරන පිනිස යාච්ඤා කරන්න

**ජන:13-** සෑම රටකම කිතුණු සංවිධාන නිසිලෙස ලියාපදිංචි කරවන පිනිස යාච්ඤා කරන්න

**ජන:14-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයට සුදුසු සේවකයන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**ජන:15-** දේව සේවය තුළ කැපවීමෙන් සේවය කරන සේවක සේවිකාවන් ගැන යාච්ඤා කරන්න

**ජන:16-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ ජීවිතකථාව සම්පූර්ණ වන පිනිස යාච්ඤා කරන්න

**ජනැ:17-** ශුභාරංචියේ වර්ධනය වීම ගැන යාච්ඤා කරන්න

**ජනැ:18-** මේ මාසය පුරාම දෙවිඳුන්ගේ පුදුම සැපයීම ගැන යාච්ඤ

4 පිටුවෙන්....

වලදී මෙවැනි අත්දැකීම් තුල ගමන් කරනු ලැබුවේය. මේ සෑම අවස්ථාවකදීම උන්වහන්සේ ගේ සමාදානය මා සමඟ තිබුනේය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයේත් අදත් සැමදාම ඒකාකාරයි.

සෑම දවසකදීම උන්වහන්සේගේ සමාදානයෙන් උන්වහන්සේ මාව පුරවන සේක. අද දවසේදී උන්වහන්සේගේ සමාදානයෙන් ඔබව පුරවන්නය කියා ඉල්ලන්න. ඔබ ගමන්කරන්නාවූ තත්වය කුමක් වුවත්, එනම්, ඔබ පාලු වලක සිටිනවා විය හැක, නැතිනම් ඔබගේ ජීවිතයට විරුද්ධව ගොලියත් වැනි යෝධයින්ගෙන් සටන් තිබෙනවා විය හැක. නමුත් මේ සියලු දේ මධ්‍යයෙහිදී යේසුස් වහන්සේ ඔබගේ ජීවිතයට සමාදානය දෙන සේක. මන්ද උන්වහන්සේ සමාදානයේ කුමාරයාය.

යේසුස් වහන්සේ උපත ආරංචි වූ මොහොතේදී සමහර මිනිසුන් කලබලයට පත්විය. තවත් සමහර අය භියට පත් විය. නමුත් තවත් සමහරු මේ ශුභාරංචිය අසා ප්‍රීතියට පත් විය. දේව දූයෝ එම පණිවිඩය එඬේරුන් වෙතට ගෙන ගියේය. *''දේවදූතයා ඔවුන්ට කථා කොට, භය නොවෙල්ලා, බලව මුළු සෙනඟට මහත් ප්‍රීති උපදවන යහපත් ආරංචි නුඹලාට ගෙනෙමි'' (ලූක් 2:10)* මේ මිනිසුන් ඉතා සරල අයයි. සාමාන්‍ය ඇඳහිල්ලේ සිටි අයයි.

අද අප තුළ තිබෙන්නාවූ සමාදානය විනාශ කරනු ලබන්නේ අප තුළ තිබෙන්නාවූ තිත්තකම හා සමාදාන නොදෙන්නාවූ ආත්මයයි. විලියම් බ්ලේක් නැමති නැතැත්තා ඉංග්‍රීසි භාෂාවෙන් ලියූ කවියක් මාගේ මතකයට නැගෙයි. එය සිංහල භාෂාවට දැමූ විට මෙලෙස දැක්විය හැක.

මගේ මිතුරා සමඟ මා තරහෙන් සිටියෙමි.

මගේ කෝපයට මා කථාකලත්, එය නතර වූයේ නැත.

මගේ සතුරා සමඟ මට තරහක් තිබුණි.

එහෙත් හම තරහා දිගටම වර්ධනය විය.

මා තුළ මහත් භියක් තිබුණි.

දිවා රෑ මාගේ ජීවිතය කඳුලින් බරවිය.

මගේ සිනහව තුළින් එය යටපත් කිරීමට වෙර දැරුවද

එය නවතාලීමට දැරූ උත්සහය නිශ්ඵල විය.

දිවා රෑ මෙය වැඩි වර්ධනය වන්නට විය.

රෑ දාවල් නොනැවතී මෙය වැඩි වර්ධනය විය

මගේ සතුරා මගේ සමාදානය නැති කලා

මගේ සතුරාටත් අන් අයටත් මා සමාව දුන්නා

එවිට අලංකාර ගසක් මෙන් මගේ ජීවිතය


දීප්තිමත් වන ආකාරය මා දුටුවෙමි.

ඉංග්‍රීසි භාෂාවෙන් ලියා ඇති මෙම කවිය බොහෝ විටදී මගේ හදවතට කථා කරයි. එනම්, අපි සමාව දෙමින් ඉදිරියට යමු. එවිට අපගේ ජීවිත තුල සමාදානය ඇතිවන්නේය. අපගේ හදවත් තුල කමා නොකිරීමක් තිබේ නම් අපට සමාදානය අහිමි වෙයි. මිනිසුන් අපට බොහෝ වැරදි කර ඇත. අප ගැන වැරදි කථා කරනවා විය හැක. එම නිසා අපට වේදනාවක් දැනෙනවා ඇත. නමුත් අපි සමාව දෙමු. දෙවියන්වහන්සේ ඔවුන් සමඟ ගණුදෙනුවක් කරනවා ඇත.

ඔබගේ ජීවිතයේ ඔබ තවමත් සමාව නොදුන්නාවූ පුද්ගලයින් සිටිනවා විය හැක. ඔවුන්ට කෙටි පණිවිඩයක් හෝ දුරකථන ඇමතුමක් ලබා දී ඔවුන්ට සමාව දී ඒවා හරිගස්වා ගැනීමට වේලාව අදයි. දෙවියන්වහන්සේ ඔබට සමාදානය දෙන සේක.

## (3). දේව අභිමුඛත්වය නැමති දීමනාව

දෙවියන්වහන්සේ අපට දුන්නාවූ තුන්වන දීමනාව නම් උන්වහන්සේගේ අභිමුඛත්වයයි. මෙය ඉතා අලංකාර වූ දීමනාවකි. උන්වහන්සේගේ නාමය එම්මානුවෙල්ය. එහි අර්ථය නම්, ''දෙවියන්වහන්සේ අප සමඟයි'' යන්නයි. උන්වහන්සේ කිසි දිනක අපව අමතක කරන්නේවත් අපව අත්හරින්නේ වත් නැත කියා අපට පොරොන්දු වී තිබේ. *''ඔබ අභිමුඛයෙහි ප්‍රීතියේ සම්පූර්ණකම ඇත්තේය....'' (ගීතාවලිය 16:11)*



In His presence,
there is fullness of joy!

දාවිත් රජතුමාට ඔහුගේ ජීවිතයේ සෑම දෙයක් එනම් මුදල් ජනප්‍රියකම, වස්තුව, බලය, හා ජයග්‍රහණය තිබුණි. නමුත් මේ සෑම දෙයටම වඩා ඔහු ප්‍රිය කරනු ලැබුයේ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුල සිටීමටයි. ඔහු පාපයට වැටුණු මොහොතේදී අනෙකුත් සෑම දේම ඔහුට අහිමි වෙයි කියන කණගාටුවක් ඔහුට නොතිබුණි. ඔහු දෙවියන්වහන්සේගෙන් වැඩියෙන්ම ඉල්ලනු ලැබුයේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ අභිමුඛත්වය ඔහුගෙන් අහක් නොකරන ලෙසයි. *''ඔබ ඉදිරියෙන් මා බැහැර*

***නොකළ මැනව, ඔබගේ ශුද්ධාත්මය මාගෙන් පහ නොකල මැනව.'' (ගීතාවලිය 51:11)***

යේසුස් වහන්සේ ස්වර්ගයට යාමට පෙර උන්වහන්සේ මෙසේ පැවසූ සේක. ***''මම පියාණන්වහන්සේගෙන් ඉල්ලන්නෙමි. එවිට උන්වහන්සේ නුඹලා සමඟ සදාකල්ම සිටින පිණිස වෙත සැනසිලිකාරයෙකු නුඹලාට දෙන සේක.'' (යොහාන් 14:16)*** එසේ නම්, දෙවියන්වහන්සේ අපට ලබා දුන් දේව අභිමුඛත්වය අද අපගේ ජීවිත තුළ තිබෙනවාද? කියා අප ස්වාමීන්වහන්සේගෙන් විමසමු. අද අපගේ පවුල තුළ, අපගේ නිවස්වල ස්වාමිපුරුෂයා හා භාර්යාව සමඟ තිබෙන්නාවූ සම්බන්ධතාවය තුළ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අද තිබෙනවාද? එසේ නොමැති නම් එම සම්බන්ධතාවයන් තුළ අද අප හා සමඟ තිබෙන්නේ ලෝකයේ අභිමුඛත්වයද? කියා අප මෙම නත්තල් සමය තුළ අප අපගෙන්ම ප්‍රශ්න කල යුතුය.

## (4). දෙවියන්වහන්සේගේ බලය නැමති දීමනාව

අපගේ ජීවිත වලට දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස් වහන්සේ විසින් දී තිබෙන්නාවූ ඊළඟ අලංකාර දීමනාව නම්, උන්වහන්සේගේ බලයයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත ගැන උත්පත්ති 3:15 හිදී දුන්නාවූ පොරොන්දුව දෙවියන්වහන්සේ ඉෂ්ඨ කරනු ලැබුවේය. යේසුස් වහන්සේ පිළිබඳව පැවසූ පළමු පොරොන්දු පදයෙහි මෙසේ පවසයි. ***''මා තා සහ ස්ත්‍රීය අතරෙහිද තාගේ වංශය සහ ඇගේ වංශය අතරෙහිද සතුරුකම තබන්නෙමි. ඒ වංශය තාගේ හිස පොඩි කරන්නේය. තෝ ඔහුගේ විලුඹ පොඩි කරන්නෙහියයි කීසේක.'' (උත්පත්ති 3:15)***

මෙම පදය තුළින් මනුෂ්‍යයා අතරේ සහ යක්ෂයා අතරෙහි ස්ථිර සතුරුකමක් ඇති විය. නමුත් යේසුස් වහන්සේගේ ඉපදීම කරණකොටගෙන යක්ෂයාට තිබූ සෑම බලයක්ම උන්වහන්සේ ඉවතට දැමුවේය. දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මට විරුද්ධව යක්ෂයා ක්‍රියාත්මක වූයේ, යේසුස් වහන්සේ ඉපදුව වේලාවේදීම ඉපදුනාවූ දරුවන්ව මරා දැමීමෙනි. එහෙත් යක්ෂයාගේ සැලැස්ම විනාශ විය. මන්ද දෙවියන්වහන්සේ යමක් සැලසුම් කලහොත් එය විනාශ කිරීමට කිසිවෙකුට නොහැකි විය. ඔබ ගැන හා මා ගැන දෙවියන්වහන්සේ තබා තිබෙන්නාවූ සැලැස්ම විනාශ කිරීමට කිසිම යක්ෂයෙක්කුට නොහැකිය. යෙසායා අනාගතවක්තෘ දුටු දර්ශනය ගැන මෙලෙස සඳහන් කර ඇත. ***''උස්සියා රජු නැසුණු අවුරුද්දේදී ස්වාමීන්වහන්සේ උස්වූ උසස්වූ සිංහාසනයක වැඩ හිඳිනවා දුටිමි. උන්වහන්සේගේ වස්ත්‍ර කෙළවරින් මාළිගාව පිරී තිබුනේය.'' (යෙසායා 6:1)***

අපගේ දෙවියන්වහන්සේ රජ කරන සේක. උන්වහන්සේගේ හස්තයෙහි සියලු බලය තිබේ. උන්වහන්සේ අපගේ මාර්ග පිළියෙල කරයි. මුහුදේ රැළි වලට උන්වහන්සේ සීමාවක් තබයි. ''මාගේ සැලැස්ම සදහටම වෙනස්නොවී'' ඔබ ගැන ක්‍රියාත්මක වෙන්නේය කියා දෙවියන්වහන්සේ පවසයි.

අපගේ ජීවිතයේ සෑම විටම අප ජයග්‍රහකයෝ වෙමින් සෑම දේ තුළින්ම, එනම්, අප මුහුණදෙනු ලබන සෑම තත්ත්වයකදීම, අපගේ පරාජික බව, පාපය, ශාපය, සහ යක්ෂයා යන මේ සියල්ලේදීම අප අතිශයෙන්ම ජයගන්නෝ වෙමුව. නත්තල් දේව ටමහෙය තුලදී අප අතිශයින්ම ජයගන්නෝ බව මතක්කර දෙයි. එළිසබෙත් එම ශාපයෙන් ජය ගත්තේය. මරියා සමාජයෙන් පැමිණුනාවූ සෑම ලැජ්ජා සහගත දෙයින් ජය ගන්න.

ඔබ තවමත් සිතන්නේ මොනවාද? අපි අතීශයින්ම ජයගන්නෝ වෙමුව.

## (5). කමා කිරීමේ දීමනාව

අවසාන වශයෙන් දෙවියන්වහන්සේ මේ ලෝකය මැවූ විටදී උන්වහන්සේ සෑමදේම ඉතා ලස්සන බවත් යහපත් බවත් දුටුවේය. නමුත් අකීකරුකම කරණකොට ගෙන පාපය ඇතුලුවූ නිසා සෑම දෙයම වෙනස් විය.

*9 වෙනි පිටුවට....*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in




# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### ''...කියවන්නා තේරුම් ගනීවා....'' (මතෙව් 24:15)

## ස්වාමීන්වහන්සේ අපට ඇහුම්කන් දෙමින් අපව මුදාහරින සේක !



*''ධර්මිෂ්ඨයෝ මොරගැසුවෝය, ස්වාමීන්වහන්සේ අසා ඔවුන්ගේ සියලු දුක්වලින් ඔවුන් ගැළවූ සේක.'' (ගීතාවලිය 34:17)*

මට ලැබුනාවූ අඩු ආදායම නිසා මගේ සේවයේ මුල් කාලයේදී මා ඉතාම සරළ වූ ජීවිතයක් ගත කලෙමි. දිනක් උදෑසන මගේ ප්‍රධාන පාළකතුමා පාස්ටර් ජී. සුන්දරම් සභාවට දැනුම්දීමක් කරමින්, ලබන ඉරුදින පෙරිය තිඩල් නැමති ශාලාවේ විශේෂ දේව මෙහෙයක් පැවැත්වෙන බව ප්‍රකාශ කලේය. එම රැස්වීමේදී මට පැවරුන රාජකාරිය නම්, එම දේව මෙහෙයට පැමිණෙන්නාවූ සියලු දෙනාගේම පාවහන් ගලවා තබා යන්නාවූ ස්ථානය බලා ගැනීමයි. එම ඉරුදිනට ඇඳීම සඳහා මා ළඟ තිබුණාවූ එකම හොඳම ඇඳුම සෝදා පවිත්‍රකර තැබුවෙමි.

එම සතියේම සිකුරාදා දින එක්තරා තරුණයෙක් මා ළඟට පැමිණ, ඔහු මගේ මිත්‍රයෙකුගේ සහෝදරයෙකු බවත් දින දෙකක් මා සමඟ ඔහුට සිටීමට හැකි ද කියා ඇසුයෙව්. ඔහුගේ ඉල්ලීමට මා කැමතිවුවෙමි. ඔහු මාගේ පරණ මිත්‍රයෙකුගේ සහෝදරයා නිසා උදවු කිරීමට මා සතුටු වූයෙමි.

ඊළඟ දින සෙනසුරාදා, මගේ නිවසින් මා එළියට ගිය විටදී මා ඉතාම විමතියට පත් කරමින් මගේ පරණ මිත්‍රයාගේ සහෝදරයා මගේ පරණ සහ අලුත් ඇඳුම්ද, ඉරුදිනට මා ඇඳීමට සූදානම් කලා වූ එම ඇඳුම් කුට්ටමද මා ළඟ තිබූ තවත් වටිනාවූ දේවල්ද රැගෙන නිවසින් පැනගොස් තිබුණි. මගේ ඇඳුම් සියල්ලත් මා ළඟ තිබූ වටිනා දේවලුත් මට අහිමි විය.

මේ හේතුව නිසා මා මහ මහත් වූ දුකක් හා වේදනාවක් දැනුනි. මන්ද ඉරුදිනට ඇඳීමට ඇඳුම් ගැනීමටවත් මට කිසිදු මුදලක් තිබුනේ නැත. කිලිටි ඇඳුම් ඇඳගෙන ඉරුදින දේව මෙහෙයට ගොස් මිනිසුන්ගේ සපත්තු භාර ගෙන ඒවා බලා ගැනීමට දැන් මා සුදුසු නැත. මන්ද මගේ පාලක තුමා පවසා තිබුනේ අපට ලස්සනට ඇඳගෙන සිටින්න ඕනි කියාය. මා ඉතාම කනස්සල්ලෙන් යුතුව දෙවියන්වහන්සේට යාච්ඤා කලෙමි. කිසියම් කෙනෙක් පැමිණ මා හට උදවු කරයි කියා බලාපොරොත්තු වුවෙමි. මා මගේ ඇදහිල්ලෙන් ටිකක් සැලුනත් දෙවියන්වහන්සේ හාස්කමක් කරයි කියා මා විශ්වාස කලෙමි.

ඊට ටික මොහොතකට පසුව මගේ නිවස ඉදිරිපිට සිට කෙනෙක් මා හට කථා කලේය. මා එළියට ගොස් ඔහුට නිවස තුළට පැමිණෙන්නය කියා කථා කලෙමි. ඔහුගේ අතෙහි සුදු පාට ඇඳුම් සහිත බෑගයක් තිබුණි. ඔහු ඒවා මට දී, ''සහෝදර සෑම්, මාස හයකට පෙර මාගේ ඥාතියෙක් විදේශ රටක සිට සුදු පාට කමිස හා කලිසම් ටිකක් මට ගෙනත් දුන්නා. ඒවා මට අඳින්නට බැරි නිසා මට හිතුනා ඒවා සියල්ලම ඔබට හරියයි කියා, ඒ නිසා මේ මා ඔබට දෙන පිණිස ගෙන ආවා'' කියා පැවසුවේය. මා ඉමහත් ප්‍රීතියෙන් හා ගුණවන්ත සිතින් මගේ දෙවියන්වහන්සේට ස්තුති කලෙමි. ඒවා විදේශ රටක ඉතාම මිළ අධික වටිනා ඇඳුම් වූ අතර ඒවා මගේ මිම්මට සරිලන ලෙසම තිබුණි.

පසුදින එනම් ඉරිදා උදෑසනම මා එම ඇඳුම් කුට්ටම් වලින් එකක් ඇඳගෙන දේවස්ථානයට ගියෙමි. මා දෙස බලා, ''සහෝදර සෑම්, ඔබ ඉතාම ලස්සන ඇඳුමක් අද ඇඳගෙන ඇවිත් සිටිනවා'' කියා පැවසීය. මා සිදුවූ සියලු සිදුවීම ඉතා කෙටියෙන් ඔහුට පැවසුවෙමි. එවිට ඔහු මගේ පිටට තට්ටුකර 'ස්වාමීන්වහන්සේට ස්තුති වේවා' කියා පැවසීය.

ගීතාවලිය 34:19 හි පවසන පරිදි *''ධර්මිෂ්ඨයාට පීඩා බොහෝය. නුමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවන සේක.''*

*******

*7 පිටුවෙන්....*

ලෝකය තුලට පාපය පැමිණීම කරණකොටගෙන මුළු මිනිස් සමාජයම එම පාපයෙන් ජය ගැනීමට නොහැකිව බොහෝ වෙහෙසට පත්ව සිටිති. සෑම ආගමකම තිබෙන්නාවූ තත්වය නම් මෙයයි. දේව වචනය තුළ, ***''.....පාපයේ කුළිය නම් මරණය...'' (රෝම 6:23)*** පවසයි. (රෝම 6:23) එනම්, පාපය කරණකොටගෙන ශාරීරික මරණය පමණක් නොව, ආත්මික මරණයද සිදුවී ඇත. පාපය කරණකොට ගෙන අපව දෙවියන්වහන්සේගෙන් වෙන්කර ඇත. නමුත් යේසුස් වහන්සේගේ ඉපදීම කරණකොටගෙන



***Forgiveness of Jesus Christ***

මෙම වෙන්වීමට තිත තැබුවේය. යේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණුනේ, අපි විඳින්නට අවශ්‍ය පාපයේ දඬුවම කුරුසියේ මරණය තුළින් උන්වහන්සේ පිටටම ගෙන එම දඬුවම ලබා ගත්තේය. යේසුස් වහන්සේගේ කරුණාව නැමති විශේෂ දීමනාව මේ නත්තල් සමය තුලදී අපට දී ඇත. උන්වහන්සේගේ පවිත්‍ර පරාර්ථකාමී ප්‍රේමය සිහි කරන්න. උන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන අදත් යේසුස් වහන්සේ අප උදෙසා මැදිහත්කම් කරයි. *(රෝම 8:34)* ස්වාමීන්වහන්සේගේ කරුණාව නිසා සමාව නොලැබීමට බැරි කිසිම පාපයක් නැත.

ප්‍රිය මිත්‍රය, මේ ලෝකයේ තිබෙන්නාවූ විවිධ දේවල්, දිනපතා අපගේ ජීවිතවල අප මුහුණ දෙනු ලබන අභියෝගයන් අපිව දෙවියන්වහන්සේගෙන් ඈත් කරයි. ඔබ දෙවියන්වහන්සේගෙන් ඈත්වී සිටිනවාය කියා ඔබට හැඟෙනවා නම්, දැනුයි වේලාව උන්වහන්සේ වෙතට හැරෙන්න.

උන්වහන්සේ ඔබට කමාව දී ඔබට උන්වහන්සේ වෙතට ලංකරගනියි. යේසුස් වහන්සේ අපට ප්‍රේම කරන නිසා උන්වහන්සේ අපට කමාව දී පිළිගැනීමට සූදානම්ව සිටී. අප උන්වහන්සේ සමඟ තිබෙන්නාවූ පුද්ගලික සම්බන්ධතාවය වැඩිකර ගනිමු.

ප්‍රිය සහෝදරයිනී, මෙම නත්තල ඔබට සැබෑ අර්ථවත් නත්තලක් වේවා. සමාදානයේ කුමාරයා විසින් අපට දෙනු ලැබුවාවූ මෙම දීමනාවන් 5 ම අපි භුක්ති විඳිමු. කොපමණ කාලයක් ගතවුවත් ස්වාමීන්වහන්සේ පොරොන්දු වූ පොරොන්දු ඉෂ්ඨ කරන බව විශ්වාස කරන්න. ඔබගේ ජීවිතයට එරෙහිව කොපමණ කුණාටු තිබුනත් ඒ තුල උන්වහන්සේ ඔබට සමාදානය දෙන බව විශ්වාස කරන්න. උන්වහන්සේගේ අභිමුඛත්වය නිරතුරුවම අප හා සමඟ තිබේ. අප එම අභිමුඛත්වය නොදැනුනත්, එය නොදුටුවත් අපගේ අන්තිම හුස්ම තිබෙන තුරාවටම උන්වහන්සේ අප හා සමඟ සිටී. උන්වහන්සේ බලසම්පන්නයි. එම නිසා අප භියවීමට අවශ්‍ය නැත. උන්වහන්සේ අපට ජයග්‍රහණය දෙනවා පමණක් නොව අප අතිශයෙන්ම ජයගන්නෝ වෙමුව. ඔබව වැළඳගැනීමට උන්වහන්සේ දෑත් දිගුකරගෙන බලා සිටිනවා. ඔබ ඉන්නාවූ ආකාරයෙන්ම උන්වහන්සේ වෙතට යන්න.

සමාදානයේ කුමාරයාගේ දීමනා 5 ම ඔබ අත්පත් කරගන්න. මේ නත්තල සැබෑ අර්ථවත් සුභ නත්තලක්ම වේවා !

ඔබ සියලු දෙනාටම ඉතා ප්‍රීතිමත්, අසිරිමත් හා අර්ථවත් සුභ නත්තලක් වේවා කියා ප්‍රාර්ථනා කරමි.

*******

RNI NO. TN/SIH/2006/17846

## NEED LIBRARY BOOKS

We are in need of **Tamil, , English and Hindi books** for our Libraries at **St. Paul's Matriculation School and Nehemiah Bible Colleges.** If you have new or old books in good condition and If you have new or old books in good condition and are willing to donate, please get in touch with us.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## URGENT

We need about 1000 Hindi Christian Books for our Nehemiah Bible Colleges. Please inform us the possibility of procuring the theological Hindi books.

- Pr. S. Sam Selva Raj, Editor
+91-98412 71858

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/-    ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd DECEMBER 2023.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**